00461

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II -2022/2023

LLU3406 - ව්‍යවස්ථා සහ ලේඛණ අර්ථනිරූපණය

කාලය : පැය 01

---

දිනය : 24.10.2023 කාලය : පෙ.ව. 1.30 - පෙ.ව.2.30

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 02

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. ඔලිවර්,ඇලෝනියාවෙහි බිල්ඩ්වෙල් ඉදිකිරීමේ සමාගමෙහි ඉදිකිරීම් කම්කරුවෙකු වූ අතර වර්ෂ 2020 දී ඔහු සමග සේවය කරන කම්කරුවෙකු වැඩබිමේදී විශාල උසකින් ඇදවැටෙනු දුටුවේය.මේ සිද්ධිය හේතුවෙන් ඔලිවර් තීව්‍ර භාවාත්මක පීඩාවකට සහ කම්පනයකට පත් වූ අතර එම තනතුරෙහි අඛණ්ඩව සේවය කිරීමේ ඔහු සතු හැකියාවටද එය බලපාන ලදී. එම සමාගමෙහිම අඩු පීඩාවක් ගෙන දෙන තනතුරකට තමාව මාරු කරන ලෙස ඔහු ඉල්ලා සිටියද, සමාගම ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. ක්‍රමයෙන් පිරිහෙමින් තිබූ මානසික සෞඛ්‍යය හේතුවෙන්, ඔලිවර් වර්ෂ 2021 දී බිල්ඩ්වෙල් ඉදිකිරීම් සමාගමෙන් ඉල්ලා අස්විය. වැඩ බිම්බවල සිදුවීම් මගින් උද්ගත වූ හානි ආවරණය කෙරෙන ඇලෝනියාවේ 1983 අංක 12 දරණ කම්කරු වන්දි පනත යටතේ වන්දි ලබා ගැනීමට ඔහු දැන් අපේක්ෂා කරයි. පනතේ පූර්විකාව මගින් දක්වන්නේ, සේවය සම්බන්ධ හානි සහ එම හානි සම්බන්ධයෙන් සේවකයන් සඳහා ලබා දෙන වන්දි ඵලදායී ලෙස කළමණාකරණය කිරීම තුළින් සේවකයන්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුබසාධනය සුරක්ෂිත කිරීම සඳහා සහාය වීම පනතේ අරමුණ බවයි.ආරක්ෂිත විධිවිධානයන්ට පටහැණිව හිතාමතා කරනු ලබන අකීකරුකම් හේතුවෙන් හැර වැඩබිමේදී සිදු වන පුද්ගලික පීඩාවන්ට වන්දි ගෙවීමට සේවා යෝජකයන් වගකීමෙන් බැඳෙන බව 9 වන වගන්තිය මගින් දක්වයි. කෙසේ වෙතත් 17 වන වගන්තියෙහි “පුද්ගලික හානි” යන්නෙහි නිර්වචනය සම්බන්ධයෙන් වාදයක් ඉස්මතුව ඇත. එම වචනය කායික පීඩාවක් සඳහා පමණක්ම සුවිශේෂයෙන් අදාළ වන බවත් මානසික සෞඛ්‍ය,

දේපළ හෝ කීර්තිය කෙරෙහි සිදු වන හානි ඊට යටත් නොවන බවත් බිල්ඩ්වෙල් ඉදිකිරීම් සමාගම තර්ක කරයි.

ඇලෝනියාවේ කම්කරු වන්දි පනත යටතේ ඔලිවර්ට වන්දි ලබාගැනීමට ඇති හැකියාව පරීක්ෂා කරන්න. ඔබේ පරීක්ෂාවේදී අදාළ අර්ථ නිරූපණ රීතීන් සහ අභ්‍යන්තර ආධාරක කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර නඩු තීන්දු මගින් ඔබේ පිළිතුර තහවුරු කළ යුතුය.

(ලකුණු - 20)

2. ග්‍රීන්විල් රජය විලෝබෲක් ගමෙහි පිහිටි ග්‍රීන් නදිය හරස් කරමින් විශාල ජල විදුලි බලාගාරයක් ඉදි කිරීමට වේල්ලක් බැඳීමේ ව්‍යාපෘතියක් යෝජනා කර ඇති අතර, එකී ගමෙහි දළ වශයෙන් 5000ක් පදිංචිකරුවන් සිටින අතර ජීවනෝපාය ලෙස වී ගොවිතැන මත විශාල වශයෙන් පදනම් වේ. විලෝබෲක් ඓතිහාසික වශයෙන් පොහොසත් ගම්මානයක් වන අතර, එවර්වුඩ් වනාන්තරය නමින් හඳුන්වන සංරක්ෂිත වනාන්තරයක්ද එහි ඇති අතර ආවේණික සත්ත්ව විශේෂ කිහිපයක් සම්බන්ධයෙන් වැදගත් වන පරිසර විද්‍යාත්මක අභය භූමියක් ද එහි ඇතුළත් වේ. ව්‍යාපෘති යෝජකයන් තර්ක කරනුයේ එමගින් ජාතිය වෙත පිරිසිදු බලශක්තිය සපයන බවත් ආර්ථිකය සංවර්ධනය වැඩි කරනු ඇති වන බවත්ය. පරිසර ක්‍රියාකාරීන් සහ ගමෙහි දේශීය ප්‍රජාව ඇතුළු විරුද්ධවාදීන් කියා සිටින්නේ, වේල්ල ඉදි කිරීමෙන් ගම්මානයේ පදිංචි ස්ථාන සහ ආවේණික විශේෂයන් සහිත අභය භූමියද ඇතුළුව වනාන්තර ප්‍රදේශයට ගංවතුර ගැලීම සිදු වනු ඇති බවයි. ග්‍රීන්විල් හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සෞඛ්‍යමත් පරිසරයකට ඇති අයිතිවාසිකම හෝ ජීවත් වීමේ අයිතිවාසිකම හඳුනා ගැනීමේ සෘජු ප්‍රතිපාදන නොමැත. කෙසේ නමුත් සමීප පරීක්ෂාවකින් අනාවරණය වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 21(අ) ව්‍යවස්ථාව මගින් ජීවත් වීමේ අයිතිය ව්‍යාංගව පිළිගෙන ඇති බවයි. ගම්වැසියකු වන ලෝරා, 17 සහ 21 (අ) ව්‍යවස්ථාවන්හි දක්වා ඇති ඇයගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට සඳහන් කරමින් රජයට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර ඇත.

සුදුසු අර්ථ නිරූපණ රීති අනුසාරයෙන් ඉහත සිද්ධිය අගයන්න. උචිත නඩු තීන්දු මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු -20)

----------නිමිකම් ඇවිරිණි-------